# යහපත් පුරවැසි ක්‍රියාකාරීත්වයක් නොමැති සමාජයක දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක් දැකිය නොහැක

මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය ගැන අද පවත්වන සාකච්ඡාව මැතිවරණ කොමිෂන් සභාව ලෙස අපට ඉතා වැදගත් එකක්. කෙසේ වුවත් වඩාත් ක්‍රියාකාරී යාන්ත්‍රණයක් සකස් කර ගැනීමේදී අඩු තරමින් යහපත් වාර්තාකරණයක් හෝ මැතිවරණ වියදම් වලට අදාළව පවත්වා ගත යුතු බවයි අපගේ අදහස. මුදල් ලැබෙන මූලාශ්‍ර, වැය කරන ආකාරය හා වැය කරන්නේ කුමක් සඳහා ද ආදී වශයෙන් වාර්තා කිරීමට අපේක්ෂකයන් සහ දේශපාලන පක්ෂ සූදානම් නම්, එය මෙම අභියෝගය ජය ගැනීමට හොඳ ප්‍රවේශයක් වන බව කිව යුතුයි.

මීට පෙර අදහස් දැක්වූ වික්ටර් අයිවන් මහතා වත්කම් හා බැරකම් වාර්තා සම්බන්ධයෙන් තම අදහස් දක්වමින් එවකට මැතිවරණ දෙපාර්මේන්තුවට බරපතල චෝදනාවක් එල්ල කරනු ලැබුවා. එනම් එකී වාර්තා යම් වෙහෙසක් දරා එකතු කලත්, කිසි දිනෙක ප්‍රසිද්ධ නොකරන බවට. සැබවින්ම මීට අදාළ නීතියේ යම් ගැටළුවක් තිබෙන බව පැවසිය යුතුයි. ඒ නිසා මේ පිළිබඳ ක්‍රියාකරන කවුරුන් හෝ අධිකරණයට ගොස් යම් තීන්දුවක් ගන්නේ නම් ඉන් අනතුරුව කිසිදු ගැටළුවක් ඇති නොවන බවයි මාගේ අදහස. මෙකී පනතේම සඳහන් වෙනවා මෙය නඩු පැවරීමේදී හානිදායක ලෙස භාවිත නොකරන බවට. ඒ නිසාම එය භාරදෙන අයවලුන්ගෙන් යම් ලියවිල්ලක් ලබාගැනීමට අප කටයුතු කරනවා. ඒ වගේම මගේ පෞද්ගලික අදහස වන්නේ මේ වන විට තොරතුරු පනත වඩාත් බලාත්මක බැවින් මෙවැනි බාධක ජයගැනීම පහසු බවයි. එය අනෙක් පනත් වලට වඩා යම් ප්‍රබලත්වයකින් යුක්තයි. එයත් උපයෝගී කරගෙන යම් අධිකරණ තීන්දුවක් ගැනීම සඳහා මෙහි අවශ්‍යතාවය දකින පිරිස් උත්සාහ කළ යුතුයි.

මැතිවරණ කොමිෂන් සභාව මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා කාලයක් තිස්සේ කටයුතු කරනවා. ඒ සඳහා කටයුතු කිරීමට කමිටුවක් පත්කොට තිබෙනවා වගේම දේශපාලන පක්ෂ තමන්ගේ සාමාජිකයන් එම කමිටුව සඳහා නිරන්තරයෙන් සහභාගීකරවීමට වග බලා ගත්තා. එම කමිටුව ගත් එක් තීරණයක් වූනේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදෙන පිරිස් සම්බන්ධයෙන් ඇති දඬුවම් වඩාත් දැඩි කළ යුතුය යන්නයි. දෙවැන්න නම් මෙකී පනතට අනුව ම සඳහන් වන පරිදි, වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදුන් අපේක්ෂකයන් හට සභාවේ අසුන් ගැනීමට නොහැකිය යන කරුණයි.

ඇත්තටම මමත් හිතන්නේ පරාජයට පත්වන අයට පවා නිශ්චිත කාලසීමාවක් තුළ එකී ප්‍රකාශ ලබා නොදුනහොත් යම් කෙටි කලකට හෝ ප්‍රජා අයිතිය පමණක් නොව අපේක්ෂකයෙකු වීමේ අවස්ථාවත් අහිමි කරනවායැයි යම් නීතියක් සම්පාදනය කළහොත් වැදගත් වන බවයි. සෑම වසරකම මාර්තු 31 වැනි දිනට ලබාදිය යුතු වත්කම් හා බැරකම් ප්‍රකාශ ජූනි මස 30 වැනිදාට පෙර ලබාදෙන ලෙස සාමාන්‍යයෙන් දැනුම් දෙනවා. අපි වරක් තීරණය කළා ජූලි මස 15 වැනිදාට පෙර එකී ප්‍රකාශ අප වෙත නොලැබෙන්නේ නම් අදාළ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවට දැමීමට අප කටයුතු නොකරන බවට. ඇත්තටම නිලධාරීන් පවා මෙම ප්‍රකාශන වසර තුන හතර නොඑවන අවස්ථා තිබෙනවා. දේශපාලඥයන්ට පමණක් මේ පිළිබඳව දොස් කීමෙන් පළක් නැහැ. මේ පිළිබඳ යම් අවබෝධයක් පවතින නිසා පරිපාලන සහ ගණකාධිකාරී සේවයේ නිලධාරීන් තම වත්කම් හා බැරකම් ප්‍රකාශ නියමිත පරිදි එවීමට කටයුතු කරන බව පෙනී ගොස් තිබෙනවා. දේශීය ආදායම් බදු වගේම නීති අංශයේ පිරිසුත් එකී ප්‍රකාශ පිළිබඳ යම් උනන්දුවකින් කටයුතු කරනවා. එහෙත් යම් යම් තාක්ෂණික සේවාවන්හි නිරත වෘත්තිකයන් මේ පිළිබඳ බලවත් උනන්දුවකින් සිටිනවාද යන්න නම් සැක සහිතයි. එවැනි අවස්ථා ඉතා අවදානම්සහගතයි. ඊට හේතුව එවැනි ප්‍රකාශයක් නොදී සිටීම ඔවුන්ගේ රැකියා අහිමිවීමට පවා හේතු විය හැකි වීමයි. අවාසනාවට මේ පිළිබඳව පවතින්නේත් එතරම් යහපත් උනන්දුවක් නොවේ. වික්ටර් අයිවන් මහතා සහ තවත් කිහිපදෙක් පමණයි ඒ පිළිබඳ බලවත් උනන්දුවකින් කටයුතු කරන්නේ. ඒ අනුව මෙම කථාබහ ඉදිරියට ගැනීම සඳහා සිවිල් සමාජයට යම් පුරෝගාමී කාර්යයක් කළහැකි.

මැතිවරණ වියදම් පාලනයට අදාළව ප්‍රචාරක වියදම් සීමා කිරීම සිතන තරම් දුෂ්කර කාර්යයක් නොවන බවයි මගේ අදහස. පුවත්පත් දැන්වීම්, පෝස්ටර් සහ විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණ ආදියට අදාළ යන වියදම් එකතු කොට මැතිවරණයට වැය කළ වියදම් වාර්තාවක් සේ පිලියෙළ කර ගැනීමේ අපහසුවක් තිබිය නොහැකයි. සේවක පඩිනඩි, ඉන්ධන සහ කෑමබීම ආදියත් ඊට එකතු කළ හැකියි. වසර 1974 වන තෙක්ම මීට අදාළව ශ්‍රී ලංකාවේ බලපැවැත් වූ මැතිවරණ නීතියට අනුව අදාළ බල

ප්‍රදේශවල තරග කරන අපේක්ෂකයන් තමන්ගේ වියදම් වාර්තා මැතිවරණ නිලධාරීන්ට ලබාදිය යුතුයි. 1998 පැවති හොරොව්පතාන මැතිවරණ කොට්ඨාශයේ අතුරු මැතිවරණය තෙක්ම මෙම නීතිය ක්‍රියාත්මක වූ බවයි මගේ මතකය. එහිදී තමයි අපි අවසන් වරට වියදම් වාර්තාවත් අරගෙන තියෙන්නේ. සමානුපාතික නියෝජන ක්‍රමයක් සමග මෙයත් අභාවයට ගියා. වසර 2020 වෙද්දී අපට හැකියාවක් තිබේ නම් මෙලෙස වියදම් වාර්තා නිසිලෙස ලබාගන්න, වසර 2025 වන විට මීට අදාළ නිසි යාන්ත්‍රණයක් සකස් කර ගැනීමේ හැකියාවක් පවතිනවා. එකවරම සුවිශාල යාන්ත්‍රණයත් සඳහා ඉල්ලීම් කරනවාට වඩා ඵලදායී වෙනවා ක්‍රමයෙන් මීට අදාළ නිසි යාන්ත්‍රණයක් සකසා ගැනීම. අපි කිසිවිටෙක අමතක නොකළ යුතුයි මහා සාගරයක් පවා පිරෙන්නේ පුංචි පුංචි ජල බිංදු එකතුවීමෙන් බව.

***මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වසර 2016 දෙසැම්බර් මස 31 වැනි දින කොළඹ දී, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය හා සබැඳිව පවත්වන ලද වැඩසටහනේදී මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා දක්වන ලද අදහස්වල සංක්ෂිප්තයකි මේ. එතුමන්ගේ දේශනය ඉතා දීර්ස එකක් වූ අතර මෙහි දක්වා ඇත්තේ සංස්කරණය කරන ලද ඉතා සංෂිප්ත අදහසක් බව කරුණාවෙන් සළකන්න.***